**ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය**

**දෙවන වාර ඇගයීම - 2017**

6 ශ්‍රේණිය | ගණිතය | කාලය : පැය 02 යි


පත්‍රය I

නම : .................................................... විභාග අංකය : ....................................

## A කොටස

ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.

1. පහත රූප අතුරින් සරල රේඛීය තල රූප යටින් ඉරක් අඳින්න.



(i) (ii) (iii) (iv)

2. විසි එකයි දශම බිංදුවයි තුන ඉලක්කමෙන් ලියන්න.

3. බල්ලා, මයිනා, ගිරවා, බළලා, නරියා, කපුටා ඉහත නම් කරන ලද සත්ත්වයින් යම්කිසි පොදු ලකුණකට අනුව කාණ්ඩ 2 කට වෙන්කර ලියන්න.

   1 කාණ්ඩය - ..........................................................................................

   2 කාණ්ඩය - ..........................................................................................

4. හිස් තැන් පුරවන්න.

   i. 20 x .................. = 2000

   ii. 1050 ÷ 10 = ...........................

5. සුළු කරන්න.

| පැය | මිනිත්තු |
|---|---|
| 3 | 15 |
| - 2 | 40 |
| | |

6. 25 <u>**1**</u>70 යන සංඛ්‍යාවේ, යටින් ඉරි ඇඳි ඉලක්කමේ

   i. ස්ථානීය අගය කීයද? ..................................................

   ii. එම ඉලක්කම මගින් නිරූපිත අගය කුමක්ද? ....................................

7. සුදුසු පරිදි > හෝ < ලකුණු යොදා හිස් කොටුව පුරවන්න.


   i. -3 ☐ -1    ii. 0 ☐ -2

8. මේසයක් උඩ තබා ඇති ඝනකයක ඇති සිරස් දාර ගණන කීයද?

9. රූපයේ පෙන්වා ඇති කෝණ කවර වර්ගයකට අයත් වේද?

a -.............................................................

b -.............................................................




10. යම් සංඛ්‍යාවක් ආසන්න 10 ට වැටයූ විට 50 වන සංඛ්‍යා මොනවාද?

11. හිස් තැන් පුරවන්න.

i. 30mm = .................. cm

ii. ....................cm = 3.25m

12. පහත ඝන වස්තූන්ගේ මුහුණතක හැඩය එම ඝන වස්තුව ඉදිරියෙන් ලියන්න.

i. ඝනකය - ..................................................................................

ii. ඝනකාභය - ..................................................................................

13. සුදුසු ඉලක්කම් යොදා හිස්තැන් පුරවන්න.

5000 - □ □ □ □ = 3274

14. හිස්තැන් පුරවන්න.

$\frac{3}{7} = \frac{\square}{14} = \frac{21}{\square}$

To download past papers visit
www.vajirapani.blogspot.com

15. 5$l$ ධාරිතාව ඇති ජලය පිරි ඇති භාජනයකින් 3$l$ 425m$l$ ප්‍රමාණයක් භාවිතා කළේ නම්, භාජනයේ ඉතිරි ජල ප්‍රමාණය කොපමණද?

16. පහත සංඛ්‍යා රටා හඳුනාගෙන ඊළඟට ආයුතු සංඛ්‍යාව හිස්තැන මත ලියන්න.

i. 1, 3, 6, 10, ......................  ii. 1, 4, 9, 16, ......................

17. 6 = 1 x 6

= 2 x 3 නම් 6 හි සියලු ම සාධක ලියන්න.

18. -4 සිට 1 තෙක් ඇති සියලුම නිඛිල සංඛ්‍යා පිළිවෙළින් ලියන්න.

19. කේක් ගෙඩියක් සමාන කොටස් 8 කට කපා කෑලි 5 ක් අනුභව කරන ලදි. අනුභව කරන ලද කොටස කේක් ගෙඩියෙන් කවර භාගයක්ද?

20. රවුම තුළ ඇති සංඛ්‍යා අතුරින් ප්‍රථමක සංඛ්‍යා තෝරා ලියන්න.

2 6 8 9

5 7 11 4


## II පත්‍රය

✓ 1 වන ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.

1. කුලක පාඩමේදී ඔබගේ ගණිත ගුරුතුමා හෝ ගුරුතුමිය ඔබ සැම පාසල ඉදිරිපිට ඇති මහාමාර්ගය අසළට ගෙන ගිය අවස්ථාව සිහියට ගන්න.
   - i. එහිදී ඔබ දුටු මාර්ගයේ ධාවනය වෙමින් පැවති වාහන වල ලේඛනයක් ලැයිස්තුගත කරන්න. (ල.3)
   - ii. ඒවා යම්කිසි පොදු ලක්ෂණයක් අනුව කාණ්ඩ වලට වෙන් කරන්න. (ල.3)
   - iii. එම කාණ්ඩ සුදුසු පරිදි නම් කරන්න. (ල.3)
   - iv. ටිපර් රථයක්, කරත්තයක්, අත්ට්‍රැක්ටරයක් ඒ අවස්ථාවේදි පාරේ ධාවනය වෙමින් පැවතියේ නම් ඒවා ඔබ නම් කරන කවර කාණ්ඩවලට අයත් වේද? (ල.3)
   - v. ඉහත ඔබ විසින් ලැයිස්තුගත කරන ලද සමූහයම ඔබ කැමති වෙනත් පොදු ලක්ෂණයකට අනුව වෙනත් ආකාරයකට කාණ්ඩ වලට වෙන් කරන්න (ල.4)


To download past papers visit
www.vajirapani.blogspot.com

2. i. රූපයෙන් දක්වෙනුයේ කවර ඝනවස්තුවක පතොරම ද? (ල.1)




   - ii මෙම පතොරමින් සෑදෙන ඝනවස්තුවේ මුහුණත් ගණන, දාර ගණන හා ශීර්ෂ ගණන වෙන වෙන ම ලියන්න. (ල.3)
   - iii මෙම පතොරමින් සෑදෙන ඝනවස්තුවේ රූපයක් ඇඳ එහි දාරයක්, ශීර්ෂයක් හා මුහුණතක් නම් කර පෙන්වන්න. (ල.3)
   - iv එහි මුහුණතක හැඩය කුමක්ද? (ල.1)
   - v ඉහත පතොරමින් සෑදෙන ඝනවස්තුවේ දාරයක දිග කොපමණද? (ල.3)

3. i. දී ඇති සෘජුකෝණාස්‍රයේ දිග හා පළල මැන රූප මත ලියන්න. (ල.2)



   - ii එම සෘජුකෝණාස්‍රයේ පරිමිතිය කොපමණ ද? (ල.2)
   - iii භාජනයක උණු ජලය 2*l* 350m*l* ප්‍රමාණයක් ඇත. එම භාජනයට ඇල් ජලය 2l 850ml ප්‍රමාණයක් එකතු කරනු ලැබේ. දැන් එම භාජනයේ ඇති මුළු ජල ප්‍රමාණය කොපමණද?
   - iv පහත සංඛ්‍යා රටාව හඳුනාගෙන එය ඔබගේ පිළිතරු පත්‍රයේ පිටපත් කරගෙන හිස්තැන් පුරවන්න.


1 = 1 = 1 x 1

1 + 3 = 4 = ...................

1 + 3 + 5 = ................... = 3 x 3

................... = ...................... = 4 x 4 (ල.4)

4. i. පහත රූපවල අඳුරු කර ඇති මුළු කොටස දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න. (ල.1)



ii එම සංඛ්‍යාව අකුරින් ලියන්න. (ල.1)

iii එම සංඛ්‍යාව ගණක රාමුවකින් නිරූපණය කරන්න. (ල.1)

iv හිස් කොටුව තුළ සුදුසු පරිදි $<$ හෝ $>$ ලකුණු යොදන්න.

a) 0.39 ☐ 0.8 b.) 3.52 ☐ 3.25 (ල.2)

v සුළු කරන්න. 3.76 + 2.84 (ල.2)

vi ගමනක් යාමට පෙර පෙරේරා මහතාගේ මෝටර් රථයේ මීටරය ඒකක 74.35 ක් විය ගමන යාමෙන් පසුව මීටරය ඒකක 100.23 ක් විය. ඔහු කොපමණ ඒකක ගණනක් ධාවනය කර තිබුණේද? (ල.3)

5. i. $\frac{3}{8}$ යන භාගය රූපයකින් නිරූපණය කරන්න. (ල.2)

ii පහත සඳහන් භාග සැදීම සඳහා හිස් කොටුව තුළ $<$, $>$ හෝ = ලකුණ සුදුසු පරිදි යොදන්න.

a) $\frac{1}{5}$ ☐ $\frac{1}{3}$ b) $\frac{5}{8}$ ☐ $\frac{5}{9}$ c) $\frac{2}{3}$ ☐ $\frac{6}{9}$ (ල.3)

iii පහත භාග ආරෝහණ පටිපාටියට සකස් කර ලියන්න.

$\frac{3}{5}$ , $\frac{3}{8}$ , $\frac{3}{7}$ (ල.2)

To download past papers visit
www.vajirapani.blogspot.com

iv සුළු කරන්න.

a) $\frac{3}{5} + \frac{1}{15}$ b) $\frac{3}{4} - \frac{5}{12}$ (ල.4)

6. i. 12 සාධක දෙකක ගුණිතයක් ලෙස ලිවිය හැකි සියලු ම ආකාර වලින් ලියන්න. (ල.3)


ii 45 හි සාධක, 3 න් බෙදීමේ ක්‍රමයෙන් සොයන්න. (ල.3)

iii පහත ප්‍රකාශන නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (X) ලකුණ ද වරහන තුළ යොදන්න.

a. 48 , 6 හි ගුණාකාරයක් වේ. ( )

b. 74, 4 හි ගුණාකාරයක් වේ. ( ) (ල.2)

iv පහත උපදෙස් අනුව හිස් අවකාශ මතක සුදුසු සංඛ්‍යා දී ඇති සංඛ්‍යා තුලින් තෝරා ලියන්න.




(ල.3)